සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

52 | S | I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 12 - 2019**

විභාග අංකය ............................ නර්තනය I කාලය පැය දෙකයි

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 100 කි.**

## I කොටස

- **අංක 01 සිට 25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ඊට අදාල අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුල ලියන්න.**

01. ජේ.ඊ. සේදරමන් මහතා සහ මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා විසින් රචනා කරන ලද කෘතීන් ලෙස සැලකේ.
    1. බලියාග පිළිවෙල සහ රටයකුම් යාග විග්‍රහය.
    2. රටයකුම් යාග විග්‍රහය හා සිංහල සැරසිලි කලාව.
    3. සිංහල සැරසිලි කලාව හා කථකලි නර්තන කලාව.
    4. කථකලි නර්තන කලාව හා බලියාග පිළිවෙල.
    5. බලියාග පිළිවෙල හා සිංහල සැරසිලි කලාව. (........)

02. කන්‍යාවන් සතර දෙනෙක් ආවැඩීම සඳහා යොදාගනු ලබන ශාන්ති කර්මය වන්නේ,
    1. කිරිමඩු ශාන්තිකර්මය ය. 2. දෙවොල් මඩු ශාන්තිකර්මය ය. 3. බලි ශාන්තිකර්මය ය.
    4. රටයකුම ශාන්තිකර්මය ය. 5. සන්නියකුම් ශාන්තිකර්මය ය. (........)

03. උඩරට වන්නමක ව්‍යුහය වන්නේ,
    1. බෙරපදය, තානම, කවිය කලාසම සීරුමාරුව අඩව්ව ය.
    2. බෙරපදය, තානම, කවිය කලාසම සීරුමාරුව අඩව්ව ය.
    3. තිත, බෙරපදය, තානම, කවිය, කලාසම, අඩව්ව ය.
    4. බෙරපදය, තානම, කවිය, කස්තිරම, සීරුමාරුව, අඩව්ව ය.
    5. තිත, බෙර පදය, තානම, කවිය ඉරට්ටිය, අඩව්ව ය. (........)

04. දුන් සුමන විවරණ - කන්ද සුරිදුගෙ බලයෙන .... යන ගායනයෙන් සබයට පැමිණෙන්නේ,
    1. සන්නියකුමේ එන අභිමානා යකාය. 2. සන්නියකුමේ එන ඊරි යකාය.
    3. ජස ලෙන්චිනා කෝලමේ එන ජසයාය. 4. නොංචි කෝලමේ එන නොංචි අක්කාය.
    5. ජස ලෙන්චිනා කෝලමේ එන ලෙන්චිනාය. (........)

05. තෙහිංතතු තෙහිංතතු තෙහිං ජිං ජිං .... යන පද කොටස වාදනය කරනු ලබන්නේ,
    1. මාත්‍රා 2+2+4 තුන් තිතටය. 2. මාත්‍රා 2+2+2+4 සිව් තිතටය.
    3. මාත්‍රා 2+2+2+4+4 පස් තිතටය. 4. මාත්‍රා 2+2+3+4 සිව් තිතටය.
    5. මාත්‍රා 2+2+3 තුන් තිතටය. (........)

06. ''නෙර්තමාලය'' නම් ග්‍රන්ථය රචනා කරනු ලැබුවේ,
    1. භරතමුණි පඬිවරයාය. 2. ගණිතාලංකාර බමුණු පඬිවරයාය.
    3. රම්මොලක අදිකාරම්ය. 4. මල්වතු විහාරවාසි හිමි නමක්ය.
    5. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුය. (........)

07. ''හිතන පතන යක්දෙහි ගුරුන්නාන්සේ ....'' යන දෙබස් ඛණ්ඩය ඇතුළත් නාට්‍යමය පෙළපාළිය වනුයේ,
1. රටයකුමේ එන නානුමුරයෙහි ය.
2. පහන්මඩුවේ එන පොත්කඩේ යක්කමේහිය.
3. කොහොඹා කංකාරියේ එන උෟරා යක්කමෙහිය.
4. රටයකුමේ එන කපුයක්කාරියෙහි ය.
5. පහන්මඩුවේ එන අඹ විදමනේය. (........)

08. චිත්‍ර කලාවේ මූලිකාංග ලෙස සැලකේ.
1. වර්ණ, රේඛා හා චලනය
2. වර්ණ, රේඛා හා නාදය
3. රේඛා, හැඩතල හා චලනය
4. වර්ණ, රේඛා, හැඩ හා හැඩතල
5. වර්ණ, හැඩතල හා චලනය (........)

09. ''තත් තක්කඩ ජික් ජික්කඩ තොං තොංගඩ නං නංගඩ මෙය,
1. උඩරට හතරවන බෙර සරඹයයි.
2. සබරගමු පස්වන දවුල් සරඹයයි.
3. සබරගමු හතරවන දවුල් සරඹයයි.
4. උඩරට පස්වන බෙර සරඹයයි.
5. උඩරට තුන්වන බෙර සරඹයයි. (........)

10. වර්ෂ 1956 දී සබරගමු වන්නම් පිළිබඳව ලියවුණු කෘතියකි.
1. නෘත්‍ය විනෝදනී
2. සබරගමු නාට්‍ය කලාව
3. වාදාංකුස රත්නමාලය
4. දහ අට වන්නම්
5. නෘත්‍ය රත්නාකාරය (........)

11. රටයකුම් ශාන්තිකර්මයේ එන නානුමුරයේ දී,
''උඩත් බැලීම් ගල් ගෝසා දිය රැල්ලා....'' යන කවිය ගායනය කරනු ලබන්නේ,
1. කුරු පැළදීමේදීය.
2. තැල්ල පැළදීමේදීය.
3. තෝඩු පැළදීමේදීය.
4. වළලු පැළදීමේදීය.
5. හවරිය පැළදීමේදීය. (........)

12. භාරතීය හින්දු දේවාලවල දෙවියන් පිදීම අරමුණු කොටගෙන ප්‍රභවය ලැබූ නර්තන සම්ප්‍රදාය වන්නේ,
1. මෝහිණී ආට්ටම්ය.
2. කුච්චිපුඩිය
3. දාසි ආට්ටම්ය
4. ඔඩිස්සිය
5. මනිපුරිය (........)

13. ''ජිංතට ගත් ජිං කඩතක ජිංතට කුං ජිං කඩතක'' මෙම අලංකාර බෙරපදය අයත් තාල රූපය වන්නේ,
1. මාත්‍රා 3 තාල රූපයයි.
2. මාත්‍රා 3 + 4 තාල රූපයයි.
3. මාත්‍රා 4 තාල රූපයයි.
4. මාත්‍රා 2 තාල රූපයයි.
5. මාත්‍රා 2 + 3 තාල රූපයයි. (........)

14. රට යකුම් යාග උපත් කථාවෙහි සඳහන් පරිදි විල්ලෝඩි දේශයේ සිට පැමිණෙන්නේ,
1. කළු කුමාරවරුන්ය.
2. රිද්දි බිසවුන්ය.
3. සන්නියකුන්ය.
4. සූනියම් යක්ෂණියය.
5. බිල්ලෙ යකුන්ය. (........)

15. රංග වස්ත්‍රාභරණ, වේදිකාව හා සංගීතය ප්‍රතිසංස්කරණයට ලක් කරමින් අඩියාර්හි කලා ක්ෂේත්‍ර ආයතනය ආරම්භ කරනු ලැබුවේ,
1. ක්‍රිෂ්ණ අයියර් විසිනි.
2. වඩිවේළු විසිනි.
3. බාලා සරස්වතී විසිනි.
4. රුක්මණී දේවි අරුණ්ඩේල් විසිනි.
5. ජිනදාස වික්‍රමසිංහ විසිනි. (........)

16. ''පටාචාර'' නම් වූ කලා කෘතියේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කර ඇත්තේ,
1. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාය.
2. ජානකී හීල් මහත්මියයි.
3. මහාචාර්ය ආරියරත්න කළු ආරච්චි මහතාය.
4. මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතාය.
5. කලාගුරු එස්. පණීභාරත මහතාය. (........)

17. ජායිපූර්, ලක්නව්, බෙනාරිස්, රායිගර් වශයෙන් ගුරුකුල දක්නට ඇත්තේ,
1. භරත නර්තන සම්ප්‍රදායේය.
2. කථක් නර්තන සම්ප්‍රදායේය.
3. මණිපුරි නර්තන සම්ප්‍රදායේය.
4. කථකලි නර්තන සම්ප්‍රදායේය.
5. කුච්චිපුඩි නර්තන සම්ප්‍රදායේය. (........)

18. ''කන්ද මුදුන්නේ පොකුණක් මවාලා'' මෙම කවි පදයේ ඇති ලඝු අක්ෂර, ගුරු අක්ෂර හා සදැස්මත් ගණන වන්නේ,
1. ලඝු 05 ගුරු 06 සදැස්මත් 17
2. ලඝු 11 ගුරු 12 සදැස්මත් 23
3. ලඝු 05 ගුරු 06 සදැස්මත් 11
4. ලඝු 11 ගුරු 06 සදැස්මත් 17
5. ලඝු 06 ගුරු 06 සදැස්මත් 12 (........)

19. රස නිෂ්පත්තියේ දී ආලම්බන හා උද්දීපන ලෙස කොටස් දෙකකට බෙදෙනුයේ,
1. අනුභාවයයි
2. ව්‍යභිචාරිභාවයයි
3. විභාවයයි
4. මනෝභාවයයි
5. ස්ථායිභාවයයි (........)

20. එවකට පැවති ගැමි නෘත්‍ය නාටක ඇසුරින් විධිමත් නර්තන සම්ප්‍රදායක් ලෙස කථකලි නර්තනය ගොඩ නැංවූයේ,
    1. කොට්ටක්කරයේ තාම්පූරන් රජුය.  2. ජැමොරින් රජුය.
    3. වල්ලතෝල් නාරායන මෙනන්ය.  4. නම්බුදරි බ්‍රාහ්මණයාය.
    5. චක්කියාර් බ්‍රාහ්මණයින්ය.  (........)

21. හින්දුස්ථානි සංගීත සම්ප්‍රදායේ කම්පතාල්වලට සමාන දේශීය තාල රූපය වන්නේ,
    1. සුළු තනි තිත ය.  2. මැදුම් මහ දෙතිත ය.  3. සුළු මහ දෙතිත ය.
    4. මහ තනි තිත ය.  5. සුළු මැදුම් දෙතිත ය.  (........)

22. ''ගැට බෙරයේ වම් ඇසේ ධ්වනිය මතුකර ගැනීමේ ස්වභාවය හඳුන්වනු ලබන්නේ,
    1. අවගාරය නමිනි.  2. ලක බුරුල නමිනි.  3. හඬ ඉර නමිනි.
    4. හැක්ම නමිනි.  5. පුල්ලෝරම නමිනි.  (........)

23. උඩරට ප්‍රදේශයේ දින හතක් පුරා වාර්ෂිකව පවත්වනු ලබන ශාන්ති කර්මයකි.
    1. කොහොඹා කංකාරිය ශාන්තිකර්මය. 2. සන්නියකුම් ශාන්තිකර්මය.  3. රටයකුම් ශාන්තිකර්මය.
    4. කිරි මඩුව ශාන්තිකර්මය.  5. වලියක් මංගල්‍යය ශාන්තිකර්මය.  (........)

24. 1990 දශකයෙන් පසු ජනප්‍රියත්වයට පත් නිර්මාණාත්මක වන්නම් දෙකක් ලෙස සැලකේ.
    1. මෙත්සිරි වන්නම හා මන්තිරි වන්නම  2. ගුරු වන්නම හා මව්ගුණ වන්නම
    3. සිරිරඟ වන්නම හා ඇඟලුම් වන්නම  4. ඇඟලුම් වන්නම හා මන්තිරි වන්නම
    5. හංසා වන්නම හා ගුරු වන්නම  (........)

25. ''අනේ මීමැස්සේ මල් රොන් ගෙන යන රිස්සේ ....''යන කවිය
    1. බඹර කවිවලදී භාවිතා වේ.  2. පන්තේරු නර්තනයේදී භාවිතා වේ.
    3. පැල්කවි ගායනයේ දී භාවිතා වේ.  4. උඩැක්කි ගායනයේ දී භාවිතා වේ.
    5. පතුරු නර්තනයේ දී භාවිතා වේ.  (........)

- **26 - 35 තෙක් හිස්තැන්වලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

26. බලි යනු ..................................................... උදෙසා කරනු ලබන ශාන්ති කර්මයකි.
27. මයුරා වන්නමෙන් වර්ණනා කෙරෙන්නේ ..................................................... දෙවියන් පිළිබඳවය.
28. ''ගුං දැහිං ගුද ගුද දැහිං'' යන බෙරපදය ..................................................... කෝලමට අයත් වේ.
29. රිද්දි යාගයේ රංග භාණ්ඩයක් ලෙස යොදා ගනු ලබන නානුමුරවට්ටිය ..................................................... නමින් ද හැඳින්වේ.
30. මෙලෙයියකකුන් හා වැදියකුන් පුද ලබන්නේ ..................................................... ශාන්ති කර්මයේදී ය.
31. පොත්තඩේ යක්කම ආරම්භ කරනු ලබන්නේ ..................................................... පිළිගැන්වීමෙන් අනතුරුවය.
32. අංගුලියාපදය තුළින් ආධුනික වාදකයකු ..................................................... යන අක්ෂර පුහුණුවේ.
33. දහ අට වන්නම යන කෘතිය රචනා කර ඇත්තේ ..................................................... මහතා විසිනි.
34. ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍ය ..................................................... නමින් ද හැඳින්වේ.
35. භරත නාට්‍ය සම්ප්‍රදායේ සංගීත ශිල්පියා හඳුන්වනු ලබන්නේ ..................................................... යන නමිනි.

- **ප්‍රශ්න අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

36. රංග භාණ්ඩ ලෙස පොල් ගෙඩිය සහ පොල් මල අතැතිව නර්තනය කරන පද විශේෂයන් දෙකකි.
    1. ............................................................  2. ............................................................

37. තුන් සුළු දෙමහ පස් තිතට අයත් නර්තන අංග දෙකක් වන්නේ,
    1. ............................................................  2. ............................................................

38. ජේනාව හා සාරංගිය භාවිතා කරන නර්තන සම්ප්‍රදායන් දෙක වන්නේ,
    1. ............................................................  2. ............................................................

39. ''උගෙ කාරිය ඌ පැළ පොල් වනසනවා''
''ඇල් සවරිය ගෙන්නා රිසි ළඳුන්නේ'' යන ගායනා ඇතුළත් නාට්‍යමය අංග දෙක සඳහන් කරන්න.
1. ............................................................ 2. ............................................................

40. කර්ණාට තාල පද්ධතියේ එන තිශ්‍රජාති හ චතශ්‍ර ජාතිවල මාත්‍රා සංඛ්‍යාවන් වන්නේ,
1. තිශ්‍ර - ............................................ 2. චතශ්‍ර - ............................................

41. භරතමුණිවරයා විසින් හඳුන්වා ඇති ප්‍රධාන රංග ශෛලීන් දෙක නම් කරන්න.
1. ............................................................ 2. ............................................................


A


B


C


D

- **ඉහත රූප ඇසුරින් 42, 43, 44 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

42. A B සහ C D රූපවල දැක්වෙන නර්තන සම්ප්‍රදායන්ට අයත් සංගීත සම්ප්‍රදායයන් නම් කරන්න.
1. A B ............................................................ 2. C D ............................................................

43. A C සහ B D රූපවල දැක්වෙන නර්තනවලට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නම් කරන්න.
1. A C ............................................................ 2. B D ............................................................

44. ඉහත B හා D රූපවලට අයත් නර්තන සම්ප්‍රදායන්වල ශීර්ෂ පළඳනා වන්නේ,
1. B රූපය - ............................................................ 2. D රූපය -............................................................

45. පින්නල් කෝලාට්ටම් හා අරිවිවෙට්ටු යන ද්‍රවිඩ ගැමි නැටුම් සිංහල ගැමි නැටුම්වලදී හඳුන්වනු ලබන්නේ,
1. පින්නල් කෝලාට්ටම්............................................... 2. අරිවිවෙට්ටු ...............................................

46. මාත්‍රා 3+4 හා මාත්‍රා 3+3 තාල රූපවලට අයත් උඩරට හා සබරගමු වන්නම් දෙකකි.
1. ............................................................ 2. ............................................................

47. ''ඒ වෛදේහ රජුගේ විධානයෙන් ආතත, විතත, විතතාතත, ඝන, සුසිරය යනාදි පංච වාර්ගික තූර්ය නාද පැවැත්වූහ'' යනුවෙන් සඳහන්වන ග්‍රන්ථය හා යුගය වන්නේ,
1. ග්‍රන්ථය ............................................... 2. යුගය ...............................................

48. මැදුම් තනිතිත හා මහ තනිතිත තාල රූපවලට සමාන හින්දුස්ථානී තාල රූපවල යේකාවන් වනුයේ,
1. ............................................................ 2. ............................................................

49. ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව සිරිලකට වැඩමවීමේ පුවත විස්තර කරමින් නිර්මාණය කරන ලද මහ බෝවන්නම ගායනය හා පද රචනය කළ ශිල්පීන් දෙදෙනා වන්නේ,
1. ගායනය - ............................................ 2. පද රචනය - ............................................

50. ''සතුන් දඩයම් කිරීම සඳහා වනගත වූ දඩයක්කරුවෙකුට අනපේක්ෂිත ලෙස වල් අලියකු මුණ ගැසේ....'' මෙම සිදුවීම තුළින් ජනිතවන භාවය හා රසය ලියා දක්වන්න.
1. භාවය - ............................................ 2. රසය - ............................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

| 52 | S | II |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 12 - 2019**

විභාග අංකය ............................ **නර්තනය II** කාලය පැය දෙකයි

- **I වන කොටසේ ප්‍රශ්න අංක 01 හා 02 අනිවාර්යවේ. II හා III කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් ඇතුලත් වන සේ ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකම I කොටසට ලකුණු (06) ක් ද II කොටසට ලකුණු (06) ක් ද III කොටසට ලකුණු (08) ක් ද වශයෙන් මුළු ලකුණු 20 බැගින් හිමි වේ.**

## I කොටස

01. i. ''තෙහිංතකු තෙහිංතකු තෙහිං ජිං ජිං - කුජිංතත් ජිංතත් ජිං තරිකිට'' ඉහත දක්වා ඇති අලංකාර බෙර පදය අදාල තිතට ප්‍රස්ථාර කරන්න.

   ii. ''ඉනු දිසාවට ඉඹුල් විමානෙට හිරු දෙව් අධිපති වන්නේ රන්සිරි වසගෙන සුරත දරාගෙන තුරඟෙකු පිට වැඩ ඉන්නේ....'' ඉහත කවි පද දෙක මහ තනිතිට ප්‍රස්ථාර කරන්න.

   iii. මයුරා වන්නනෙම් අඩව්ව මාත්‍රා 2+2+3 තාලයට සම්පූර්ණයෙන් ප්‍රස්ථාර කරන්න.

02. දේශීය නර්තන කලාව විවිධ මං ඔස්සේ විකාශනය වී ඇති බව ඓතිහාසික සාධක වලින් වැදගත් තොරතුරු සපයයි.

   i. අනුරාධපුර හා පොළොන්නරු යුගවල නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු අනාවරණය කෙරෙන මූලාශ්‍ර දෙක බැගින් නම්කර, ඉන් එක් යුගයකට අයත් සාධක දෙකක් දක්වන්න.

   ii. ඒ ඒ යුගයන්හි දී සාම්ප්‍රදායික වන්නම් බිහිවීමෙහි ලා බලපෑ ආගමික හා සමාජීය පසුබිම පැහැදිලි කරන්න.

   iii. සාම්ප්‍රදායික වන්නම නර්තනයේ නොතිබූ ප්‍රකාශනාත්මක ලක්ෂණ අන්තර්ගත කරමින් දේශීය වන්නම් හි ඇතිවූ නව ප්‍රවණතා පිළිබඳ විමසුමක් කරන්න.

## II කොටස

03. දේශීය නර්තන සම්ප්‍රදායන්හි ශාන්තිකර්මවල නාට්‍යමය අවස්ථා සුවිශේෂ රසඥතාවන්ගෙන් උප ලක්ෂිතය.

   i. උඩරට නර්තන සම්ප්‍රදායේ නාට්‍යමය අවස්ථා ගෙන හැර දැක්වීමේදී වාචික අභිනය සුවිශේෂවන බව ඌරා යක්කම ඇසුරෙන් පැහැදිලි කරන්න.

   ii. නාට්‍යමය අවස්ථා තීව්‍ර කිරීම සඳහා ආහාර්ය අභිනය යොදාගෙන ඇති අයුරු රට යකුමේ නානුමුරය උදාහරණයට කරුණු දක්වන්න.

   iii. ''පොත්කඩේ'' යක්කමේදී හාස්‍ය රසය ඉස්මතු වුවත් ශාන්තිකර්මයේ සන්දර්භය හා ද බැඳී පවතී. විමසන්න.

04. ත්‍රිවිධ නර්තන සම්ප්‍රදායන්හිම දක්නට ලැබෙන ''බලි'' ශාන්තිකර්මය අන් ශාන්ති කර්මයන්ගෙන් සුවිශේෂී වේ.
   i. ''බලි'' යන වචනය අර්ථ දක්වා එය පැවැත්වීමේ අරමුණු ලියන්න.
   ii. බලි ශාන්තිකර්මය හා බැඳී සුවිශේෂී ගායනාවක් පවතින බව උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
   iii. බලි ශාන්තිකර්මය හා චිත්‍ර කලාව අතර ඇති සහ සම්බන්ධතාව එහි භාවිත ශිල්ප ක්‍රම ඇසුරින් විමසන්න.

05. සමාජ සම්බන්ධතා හා සාරධර්ම එදිනෙදා ජීවිතය හා බැඳෙන ආකාරය රට යකුම ශාන්ති කර්මය තුළින් ප්‍රකට වේ.
   i. ශාන්ති කර්ම බිහිවීමට විවිධ ඇදහිලි හා විශ්වාස මුල් වී ඇති අයුරු රට යකුම ශාන්ති කර්මයේ පුරාවෘත්තය ඇසුරින් විස්තර කරන්න.
   ii. කලාත්මක බව උද්දීපනයවන ආකාරයට දේශීය අමුද්‍රව්‍ය මනාව හසුරුවා ඇති ආකාරය රට යකුමේ එන සැරසිලි උදාහරණයට ගෙන පැහැදිලි කරන්න.
   iii. පවුල් සංස්ථාව තුළ අඹු සැමි සබඳතා පිළිබඳ විවරණයක් රටයකුමේ කපුයක්කාරිය අංගය මඟින් සිදු කෙරේ. කරුණු දක්වමින් විමසන්න.

## III කොටස

06. පහත සඳහන් වගුවෙහි අ, ආ, ඉ යන කොටස්වලට අදාලව අසා ඇති ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.

| අ | ආ | ඉ |
|---|---|---|
| තිශ්‍ර, තිප්‍රට, චක්‍ර, ධමාර් | ජානකී නිල් | බැරිසිල් / පටාචාරා |
| මඨ, අඨ, ඛණ්ඩ, කහෙර්වා | ආරියරත්න කළු ආරච්චි | පරවිය /තිත්තබත |
| ඡම්ප, මිශ්‍ර, ත්‍රිතාල්, රූපක | ජයසේන කෝට්ටේගොඩ | හංසවිල / නට්ක්‍රැකර් |
| ඒක, දාදරා, සංකීර්ණ, ධ්‍රැව | ශ්‍රියාණි රාජපක්ෂ | කරදිය / නල දමයන්ති |

   i. (අ) කොටසේ කර්ණාට තාල පද්ධතියේ දැක්වෙන තාල හා ජාති වෙන්කොට දක්වන්න.
   ii. (ආ) කොටසේ දක්වා ඇති ශිල්පීන් අතුරින් බැරිසිල් නිර්මාණකරුවා තෝරා සමාජ සංසිද්ධියක් නිර්මාණශීලිව ඉදිරිපත් කිරීමට ගෙන ඇති උත්සාහය අගයන්න.
   iii. (ඉ) කොටසේ ඇති පටාචාර හෝ බැරිසිල් කලා කෘතියක ප්‍රාසාංගිකත්වය වර්ධනයෙහිලා සංගීතය බලපා ඇති ආකාරය විමසුමට ලක් කරන්න.

07. ආගමික පසුබිම මත ගොඩනැගුණු භාරතීය නර්තන සම්ප්‍රදායන් රාජ අනුග්‍රහය මත දියුණුවට පත්විය.
   i. භරත නාට්‍ය සම්ප්‍රදායේ ආරම්භය හින්දු ආගම පසුබිම් කරගෙන සිදුවූ බවට කරුණු දක්වන්න.
   ii. මනිපුරි නර්තනයේ ආරම්භයට බලපෑ ආගාමික පසුබිම පිළිබඳ විමසීමක් කරන්න.
   iii. කථකලි නර්තනයේ විකාශය සඳහා බලපෑ රාජ්‍ය අනුග්‍රහය පිළිබඳ ඇගයීමක් කරන්න.

08. නර්තන කලාවේ නව ප්‍රවණතා දේශීය සාම්ප්‍රදායික නර්තනය කෙරෙහි බලපා ඇත. පහත සඳහන් ශීර්ෂ ඔස්සේ පැහැදිලි කරන්න.
   i. සාම්ප්‍රදායික නර්තනය තුළ ඇති වූ ප්‍රවණතා.
   ii. අධ්‍යාපනික විෂයක් ලෙස විකාශනයේ දී ඇති වූ ප්‍රවණතා.
   iii. ප්‍රාසාංගික කලාවක් ලෙස ඇති වූ ප්‍රවණතා.

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## තෙවන වාර පරීක්ෂණය - 2019

| 12 ශ්‍රේණිය | නර්තනය I | පිළිතුරු පත්‍රය |
|---|---|---|


### I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 1. 1 | 6. 2 | 11. 2 | 16. 2 | 21. 5 |
| 2. 3 | 7. 3 | 12. 3 | 17. 2 | 22. 2 |
| 3. 4 | 8. 4 | 13. 1 | 18. 1 | 23. 5 |
| 4. 2 | 9. 4 | 14. 2 | 19. 3 | 24. 4 |
| 5. 5 | 10. 1 | 15. 4 | 20. 3 | 25. 2 |

26. නවග්‍රහයින් 27. කතරගම 28. ජස 29. උනුනුපියන
30. කොහොඹා කංකාරි 31. බුලත් 32. තත්, ජිත්, තොං, නං 33. සී.ද.එස්. කුලතිලක
34. ඉඟි නළු 35. මුත්තුකාරන් 36. 1. පොල් පදය 2. මල් පදය
37. 1. මංගලම් නැටුම 2. මුල් මාත්‍රය 38. 1. මනිපුරි 2. කතක්
39. 1. ඌරා යක්කම 2. නානුමුරය 40. 1. තුනයි (3) 2. හතරයි (4)
41. 1. ලෝක ධර්මී 2. නාට්‍ය ධර්මී
42. 1. කර්ණාටක සංගීත සම්ප්‍රදාය 2. හින්දුස්ථානී සංගීත සම්ප්‍රදාය
43. 1. A - මෘදංගය C - තබ්ලාව / පක්වාජ්
2. B - චෙන්ඩාව D - පුං බෙරය / බෝල් බෙරය
44. 1. B රූපය - ක්‍රීටම් 2. D රූපය - කොක්තුම්බි
45. 1. ලී මල්ලිය 2. ගොයම් නැටුම 46. 1. මුසලඩි වන්නම 2. කොවුලා වන්නම
47. 1. උම්මග්ග ජාතකය 2. කුරුණෑගල
48. 1. ධා ධී නා ධා තු නා
2. I. ධා ධිං ධිං ධා, ධා ධිං ධිං ධා ධා තිං තිං තා තා ධිං ධිං ධා
II. ධා ගෙ න ති න ක ධි න
49. 1. ඩබ්.ඩී. අමරදේව මහතා 2. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතා
50. 1. භාවය - භය 2. රසය - භයානක

### II පත්‍රය - I කොටස

01. i.



නිවැරදිව ප්‍රස්ථාර කිරීම - තාල සංකේත - ල. 02
ප්‍රස්ථාර කිරීමට ල. 04
ල. 06

ii.

| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | ඉන් | ද | දි | සා | - | ව | ට | - | ඉඳු | ල් | නි | මා | - | නෙ | ට | |
| + | ඉරු | දෙ | නි | ගු | ණි | ග | ති | - | වන් | නේ | - | - | - | - | - | |
| + | රන් | සි | රි | ව | ස | ගෙ | න | - | සුර | ස | ද | රා | - | ගෙ | න | |
| + | සුළ | ගෙ | පු | සි | ට | ක | ඩ | - | ඉන් | නේ | - | - | - | - | - | ගෝ |
| + | + | ඉන් | - | ද | - | දි | - | සා | - | - | - | ව | - | ට | - | |
| + | + | ඉ | ඳු | ල් | - | නි | - | මා | - | - | - | නෙ | - | ට | - | |
| + | + | ඉ | රු | දෙ | - | නි | - | ගු | - | ණි | - | ග | - | ති | - | |
| + | + | වන් | - | නේ | - | - | - | - | - | - | - | - | - | - | - | |
| + | + | රන් | - | සි | - | රි | - | ව | - | ස | - | ගෙ | - | න | - | |
| + | + | සු | ර | ස | - | ද | - | රා | - | - | - | ගෙ | - | න | - | |
| + | + | සු | ළ | ගෙ | - | පු | - | සි | - | ට | - | වැ | - | ඩ | - | |
| + | + | ඉන් | - | නේ | - | - | - | - | - | - | - | - | - | - | - | |

තාල සංකේත නිවැරදිව දැක්වීම - ල. 02
නිවැරදිව ප්‍රස්ථාර කිරීම - ල. 04
මුළු ලකුණු - ල. 06

iii.

| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | + | + | + | තත්ර | ජිං | ගුං | කුං | තත් | ජිං | ගුං | ගත් | ජිං | ගුං |
| තරි | කිට | තකු | දිත් | තත්ර | ජිත් | - | + | + | + | + | තත්ර | ජිං | ගුං |
| කුං | තත් | ජිං | ගුං | ගත් | ජිං | ගුං | තරි | කිට | තකු | දිත් | තත්ර | ජිත් | - |
| + | + | + | + | තත්ර | ජිං | ගුං | කුං | තත් | ජිං | ගුං | ගත් | ජිං | ගුං |
| තරි | කිට | තකු | දිත් | තත්ර | ජිත් | - | තරි | කිට | තකු | දිත් | තත්ර | ජිත් | - |
| තරි | කිට | තකු | දිත් | තත්ර | ජිත් | - | තරි | කිට | තකු | දිත් | තත්ර | ජිත් | - |
| කිත් | - | තත් | - | කි | ත | ක | තත්ර | ජිත් | තත්ර | ජිත් | තත්ර | ජිත් | - |
| කිත් | - | තත් | - | කි | ත | ක | තත්ර | ජිත් | තත්ර | ජිත් | තත්ර | ජිත් | - |
| කිත් | - | තත් | - | කි | ත | ක | තත්ර | ජිත් | තත්ර | ජිත් | තත්ර | ජිත් | - |
| තත්ර | ජිත් | තත්ර | ජිත් | තත්ර | ජිත් | - | තත්ර | ජිත් | තත්ර | ජිත් | තත්ර | ජිත් | - |
| තත්ර | ජිත් | තත්ර | ජිත් | තත්ර | ජිං | ගුං | කුං | තත් | ජිං | කුඳි | ගත් | ජිං | ගුං |
| තරි | කිට | තකු | දිත් | තත්ර | ජිත් | - | ගත් | - | තත් | - | ත | ක | ට |
| තරි | කිට | තකු | දිත් | තා | | | | | | | | | |

තාල සංකේත නිවැරදිව දැක්වීම - ල. 02
නිවැරදිව ප්‍රස්ථාර කිරීම - ල. 06
මුළු ලකුණු - ල. 08
20

02. i. * අනුරාධපුර හා පොළොන්නරු යුගවල නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු අනාවරණය කෙරෙන මූලාශ්‍ර 02 බැගින් නම්කර, ඉන් එක් යුගයකට අයත් සාධක දෙකක් දක්වන්න.

* මහාවංසය, රසවාහිනිය, දීපවංශය, ථූපවංශය, සියබස්ලකර, සැස්සේරුව, කොරවක්කගල ලෝ ලිපි, රූකම්, ලෝකඩ රූප.... ආදි අනුරාධපුරයේ තොරතුරු ලැබෙන මූලාශ්‍ර

* මහාවංසය, චූල වංශය, රූකම්, නාට්‍ය ශාලා, ශිලා ලේඛන, ගල් ආශ්‍රිත ලිපි, සෙල්ලිපි .... පොළොන්නරු යුගයේ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර.... තුනක් නම් කිරීමට ල - 02

ඉන් එක් යුගයක සාධක දෙකක් ලියා ඇත්නම් ල - 04

ල - 06

ii. ඒ ඒ යුගයන් හි දී සාම්ප්‍රදායික වන්නම් බිහිවීමෙහි ලා බලපෑ ආගමික හා සමාජීය පසුබිම සාකච්ඡා කරන්න.

* උඩරට වන්නම් රචනා කිරීමේ දී ගණිතාලංකාර නම් පඬිවරයා මල්වතු විහාරවාසී භික්ෂු නමකගේ සහාය ලබාගත් බව.
* මෙම වන්නම් කවිකාර මඩුව ආශ්‍රිතව ගායනය සඳහා රචනා වූ බව.
* දෙවුන්දර දේවාලයේ උපුල්වන් දෙවියන් වෙනුවෙන් සිංදු වන්නම් රචනා කොට ගායනය කළ බව.
* දඹදෙණි යුගයෙන් පසු කාලයක දී රචනා වූ සබරගමු වන්නම් ශිල්පියා ප්‍රාගුණ්‍යය ප්‍රදර්ශනය කිරීමට තරඟකාරී ස්වරූපයෙන් ගැයූ බව.
* සිංදු වන්නම් ......... ගැයූ අතර උඩරට හා සබරගමු වන්නම් ........... රචනා වූ බව.
* ගායනය සඳහා ප්‍රභවය වූ මෙම වන්නම් විවිධ අවස්ථාවල විවිධ වූ අවශ්‍යතා සඳහා ගායනය කරමින් නර්තනය කර ඇති බව.... ආදී වශයෙන් කරුණු ලියා ඇත්නම් (ලකුණු 06)

iii. සාම්ප්‍රදායික වන්නම්වල නොතිබූ, ප්‍රකාශනාත්මක ලක්ෂණ අන්තර්ගත කරමින් දේශීය වන්නම් හි ඇති වූ නව ප්‍රවණතා පිළිබඳ විමසුමක් කරන්න.

* දේශීය වන්නම් කාලානුරූපීව නවීකරණයන්ට බඳුන්වීම නව ප්‍රවණතාවක් බව.
* ගායනයට රචනා වූ සාම්ප්‍රදායික වන්නම් නර්තනයට යොදා ගැනීම.
* වන්නම් හි තේමාව ඉස්මතුවන පරිදි ප්‍රකාශනාත්මක චලන එක් කරමින්, රංග වින්‍යාසය විවිධත්වයෙන් ඉදිරිපත් කිරීම.
* තිග්ගවෙල ගුණයා මහතා සමනල වන්නම නිර්මාණය කොට තරු ආශ්‍රය කරමින් ප්‍රකාශනාත්මක චලන ඉදිරිපත් කිරීම.
* සම්ප්‍රදායික චලන වලින් බැහැරව බටහිර, භාරතීය චලන එක්කොට නිර්මාණය කිරීම.
* පැනීම්, කැරකීම්, ප්‍රකාශණාත්මක චලන, මුද්‍රා ආදිය භාවිත කිරීම.

ආදී කරුණු ඇසුරින් පිළිතුර ලියා ඇත්නම් (ලකුණු 08)

## II කොටස

03. i.
* ඌරා යක්කමෙන් මලය රජුගේ උයන විනාශ කළා යැයි සැලකෙන ඌරා පිළිබඳව හා එම සිද්ධිය පිළිබඳව කියැවෙන බව.
* කොහොඹා කංකාරියේ අනෙකුත් නාට්‍යයම අවස්ථාවලදී මෙන්ම මෙහි දී ද ඌරා යක්කමට සම්බන්ධ කථා පුවත ඉදිරියට ගෙන යනු ලබන්නේ යක්දෙස්සා සහ බෙරකරුවා අතර ඇතිවන සංවාද මඟින් බව.
* එහි දී හාස්‍ය මුසු සංවාද, දෙපැත්ත කැපෙන වචන ගායනා ආදිය භාවිතවන බව.
* එමඟින් සිද්ධිය ප්‍රේක්ෂකයාට ඉදිරිපත් කෙරෙන අතර අනෙක් අභිනයන් විශේෂත්වයක් නොලැබෙන බව උදාහරණ දක්වමින් පැහැදිලි කර තිබීම. (ලකුණු 06)

ii.
* නෘත්‍ය ලක්ෂණවලින් අනූන නානුමුරයෙන් රිද්දි බිසව් දිය නා, සළු පිළි පළඳින ආකාරය දක්වා අවස්ථා 12ක් නිරූපණය වන බව.
* එම දොළහ පෙළපාලියේ දී ආංගික, සාත්වික සහ වාචික අභිනයට මෙන්ම ආහාර්ය අභිනයට ද ප්‍රධාන තැනක් හිමිවන බව.
* ඒ අතර පිරිමි යකැදුරෙකු රිද්දි බිසව් සේ ස්ත්‍රී වෙස් ගන්නා බව.
* ප්‍රකාශනාත්මක චලන තාලානුකූලව ඉදිරිපත් කිරීමේ දී පහතරට බෙරය අනුසාරයෙන් සුවිශේෂි පද වාදනය කරන බව.
* නානුමුර වට්ටිය (උනනු පියන) සුවිශේෂ කොටගත් රංග භාණ්ඩ භාවිතා කරන බව.
මේ ආකාරයට ආහාර්ය අභිනය භාවිතා කෙරෙන බවට කරුණු දක්වා තිබීම. (ලකුණු 06)

iii.
* පොත් කඩේ පාලිය සබරගමු පහන් මඩුවෙහි එන නාට්‍ය රංග අවස්ථාවක් බව.
* ප්‍රධාන යකැදුරා හා දවුල් වාදකයා අතර කෙරෙන සංවාද මඟින් බෙහෙවින් හාස්‍ය උත්පාදනය කෙරෙන්නක් බව.
* ඇඳුරාට බුලත් අත පිළිගැන්වීමේ අවස්ථාවට අදාල සංවාද සහ සිද්ධිදාමයේ අතුරු කථාවලින් හෙලිවන සමාජ සංසිද්ධි උපහාසයට ලක් කරමින් හාස්‍ය උපදවන බව.
* එම කථාවලදී ගොයමට වැළඳෙන රෝග ස්ත්‍රී හා සම්බන්ධ කරමින් හාස්‍ය උපදවන බව.
* පහන් මඩු ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු වන්නේ ද වගා හානි, ලෙඩ දුක් අපල උපද්‍රවවලින් අත්මිදීම සඳහා පත්තිනි මෑණියන් ඇතුළු දෙවි දේවතාවුන් පුද පිදවිලි ලබාදීමබව. පොත්කඩේ පාලිය එම කර්තව්‍යය කර දෙන ලෙස යකදුරාට කෙරෙන ආරාධනාවක් ලෙස ඉදිරිපත් කරමින් ශාන්ති කර්මයේ සන්දර්භය හා සම්බන්ධ කර ඇති අයුරු විමසුමට ලක්කර තිබීම. (ල. 08)

04. i.
* ''බලි'' යන්න විවිධ අවස්ථාවන්හි දී පුද පිදවිලිදීම යන අර්ථයෙන් සඳහන්වන බව.
* බ්‍රාහ්මණික සාහිත්‍යයේත්, විවිධ සාහිත්‍යය ග්‍රන්ථවලත් බුද්ධ කාලීන සමාජයේත්, බෞද්ධ සාහිත්‍යයෙත් විවිධාකාරයෙන් බලි යන වචනය යෙදී ඇති බව ඒ අනුව බලි යනු පූජාර්ථයෙන් කරන ක්‍රියාවක් බව දක්වා තිබීම.
* බලි ශාන්ති කර්මය නවග්‍රහයින්ගෙන් සිදුවෙනවායැයි සැලකෙන අපල උපද්‍රවවලින් අත් මිදී මානසික සුවය ලබා ගැනීමේ අරමුණින් නව ග්‍රහයින් උදෙසා කරනු ලබන ශාන්තිකර්මයක් බව ආදී වශයෙන් කරුණු දක්වා තිබීම. (ල. 06)

ii.
* බලි ශාන්තිකර්මය හා බැඳි විශාල ගීත සාහිත්‍යක් ඇති බව.
* ඒවා විවිධ තිත් ප්‍රභේදයන්ට අදාලව අලංකාර නාද මාලාවලින් යුක්ත බව.
* අෂ්ඨක, ග්‍රහ පන්ති, සිරසපාද, කඩතුරා, බලි මඩුපුරය, ඇඹුම් කවි, හිං හතර කවි යනාදී වශයෙන් විවිධ ගායනාවන් ඇති බව.
* බුදුගුණ වර්ණනාවන්ගෙන් යුක්ත බව.
* බලි මඩුපුරය, ග්‍රහ පන්ති, හිං හතර කවි යනාදිය බලි ශාන්ති කර්මයටම සුවිශේෂී බව. (ල. 06)

iii. * අන්‍ය ශාන්තිකර්මවලට වඩා දේශීය චිත්‍ර කලාවේ මූල ධර්ම හා ශිල්ප ක්‍රම බලි ශාන්ති කර්මය හා බැඳී පවතින බව.

* බලි ඇඳීම, බලි ඇඹීම බලි ශාන්ති කර්මයේ අන්තර්ගත අතර චිත්‍ර කලාව හා ඇඳීම, ඇඹීම ඍජු වශයෙන් සම්බන්ධ බව.
* එම ශිල්ප ක්‍රම භාවිත කරමින් අඳින සහ අඹන බලින ස්වභාවික අමුද්‍රව්‍ය හසුරුවමින් වර්ණ ගන්වන බව.
* චිත්‍ර කලාවේ ශිල්ප ක්‍රම භාවිත කරමින් වර්ණ, රේඛා, හැඩ හා හැඩතල යන මූලිකාංග ඇසුරු කරමින් කලාත්මකව බලි ශාන්ති කර්මයේ දී භාවිතවන බව. යනාදී කරුණු දක්වමින් විමසා තිබීම. (ල. 08)

05. i. * යක්ෂයින්, භූතයින්, දෙවියන්, ග්‍රහයින් ආදී අදෘශ්‍යමාන පිළිබඳව වූ විවිධ විශ්වාස මත ගොඩ නැඟුණු ඇදහිලි, ස්වභාවික වස්තූන්, මළවුන් ඇදහීම යනාදිය ප්‍රමුඛව ගොඩ නැඟී ඇති විවිධ විශ්වාසයන් ඇති බව.

* ඒවායින් සිදුවෙතැයි විශ්වාස කරන අපල උපද්‍රවවලින් අත්මිදීමට එම බලවේග සතුටු කිරීමට උදෙසා පුද පිදවිලි දීමේ ක්‍රියාපටිපාටියන් ලෙස ශාන්තිකර්ම බිහිවී ඇති බව.
* රට යකුම යක්ෂයින් ඇදහීම මුල් කොටගෙන බිහි වී ඇති බව හා ඒ හා බැඳුණු සුවිශේෂී විශ්වාස හා ඇදහිලි පවතින බව උදාහරණ දෙමින් විස්තර කර තිබීම. (ල. 06)

ii. * රට යකුම හා සම්බන්ධ තොරණ හතකින් සමන්විත රට යකුම් වීද ප්‍රමුඛ අනෙකුත් තොරණ, විවිධ පිදේනි තටු, කත්තිරික්ක, වීදි, කපාල කුඩුව, උනනු පියන කුමාර බලි, කපුයක්කාරියේ දී ගැනෙන රංග භාණ්ඩ ස්වභාවික අමුද්‍රව්‍ය භාවිත කරමින් කලාත්මකව සකස්කර ඇති අයුරු විස්තර කර තිබීම. (ල. 06)

iii. * කපුයක්කාරිය රට යකුමේ එන නාට්‍යමය පෙළපාලියක් බව.

* කොට්ටෝරුවා සහ යකැදුරා අතර කෙරෙන සංවාද මඟින් එම අවස්ථාව ඉදිරිපත් කෙරෙන බව.
* පැදුරක් මත හිඳ දීර්ඝ වේලාවක් සංවාද ඉදිරිපත් කිරීම සුවිශේෂී බව.
* එහිදී අඹු සැමි සම්භෝගය පිළිබඳ විවිධ කරුණු ඉදිරිපත් කෙරෙන බව.
* ස්ත්‍රීන් වඳවීම කෙරෙහි ස්වාමියාගේ දුර්වලකම්, අලසකම් බලපාන බව ඒ අනුව පවුල් සංස්ථාව දුර්වලවන බව යනාදී කරුණු ඉදිරිපත් කරමින් පවුල් සංස්ථාව පිළිබඳ විවරණය කෙරෙන කරුණු දක්වා තිබීම. (ල. 08)

(ල. 20)

## III කොටස

06. i.

| තාල | ජාති |
|---|---|
| ඒක | තිශ්‍ර |
| රූපක | චතුශ්‍ර |
| ත්‍රිප්‍රට | ඛණ්ඩ |
| මඨ | මිශ්‍ර |
| ඣම්ප | සංකීර්ණ |
| ධ්‍රැව | |
| අට | |

වෙන්කොට දැක්වීමට (ල. 06)

ii. * බැරිසිල් මහාචාර්ය ආරියරත්න කළු ආරච්චි මහතා.

* සමාජ සංසිද්ධියක් තේමාකොට ගෙන ඇති මෙම මුද්‍රා නාට්‍ය හාස්‍ය හා උපහාසය කැටිකොටගත් කලාත්මක නිර්මාණයක් බව.
* සමාජයේ ජීවත්වන පුද්ගලයන් දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදු කරන්නාවූ දුර්වලකම් නිර්මාණාත්මකව හුවා දක්වන බව.
* අවස්ථානුගතව කැප අකැප දේ තේරුම් නොගෙන හැසිරීම හා අවබෝධයෙන් තොරව අනුන් කරන නිසා යමක් කරන්නට යාමේ ප්‍රතිඵල උපහාසාත්මකව ගෙන හැර පෑ නිර්මාණයක් බව.
* පන්සලේ සිල් ගත් පිරිසකගේ හැසිරීම් තේමාවී ඇති නිර්මාණයක් බව. ආදී ලෙස ඇගයීමට ලක්කර තිබීම. (ල. 06)

iii. බැරිසිල් නාට්‍ය

* පහතරට නර්තන සම්ප්‍රදායේ නොංචි චරිතයේ බෙරපදය යොදාගෙන තිබීම.
* පහතරට බෙරය යොදාගැනීමෙන් එම චරිතවල ස්වභාවය තීව්‍ර කිරීමට සමත්වී ඇති බව.
* පසුබිම් සංගීතය පමණක් යොදා තිබීම විශේෂ බව.

පටාචාරා නාට්‍ය

* ආරම්භයේ පටන් අවසානය තෙක් නොනැවතී ගලායන විවිධ සංගීතඛණ්ඩ සහ නාදමාලා මෙම නාට්‍ය විකාශනයට අත්වැලක් වන බව.
* මෙම නිර්මාණ චරිත ප්‍රේක්ෂකයාගේ සිත්තුල දෝංකාර නංවන්නටතරම් සංගීත නිර්මාණකරුවන් සමත්වී ඇති බව.
* සසර කතරේ අතරමං වූ අනේකවිධ ස්ත්‍රී චරිතවල විලාපය ඉතා නිර්මාණාත්මක ලෙස ඉදිරිපත් කර ඇති බව. ආදී ලෙස ගැලපෙන කරුණු දක්වා ඇත්නම්. (ල. 08) (ල. 20)

07. i. * දේවාලවල දෙවියන් වෙනුවෙන් ඇපකැප වූ කාන්තාවන් (දේවදාසීන්) විසින් පුද පූජා කිරීමෙන් හරත නැටුම ඇති වූ බව.
* මුල් යුගයේ දේවාලවල මෙන්ම සමාජ උත්සවවලද දාසි අට්ටම් රඟ දැක්වූ බව.
* තංජෝරයේ දාසි අට්ටම් ප්‍රචලිත වූ අතර දේවාල 500ක් පමණ දාසීන් එකවර නර්තනය කලබව.
* දේවාලවල රාජකාරී ස්වභාවය අනුව දේවදාසීන් වර්ගීකරණයක් ඇති බව.
* තාංජෝරයේ පන්දනාලූර් පෙලපතෙහි දාසි අට්ටම් සඳහා ප්‍රවීන පරපුරක් සිටි බව.
ආදී ලෙස ගැලපෙන පරිදි කරුණු දක්වා ඇත්නම්. (ල. 06)

ii. මනිපුරි නර්තනයේ ආරම්භය දේව සංකල්පමත බිහි වූ බවට කරුණු ඇත්නම්.
* ශිව පාර්වතී කථාව
* භාග්‍ය චන්‍ද්‍ර රජුගේ සිහිනය සහ රාජකාර්තා රජුගේ කථා පුවත
* රාධ ක්‍රිෂ්ණ දේවකථා පුවත් .... ආදී
ආගමික පසුබිම උදාහරණ සහිතව ඉදිරිපත් කර තිබේ නම් (ල. 06)

iii. * පාමාබා රජුගේ දායකත්වය
* රාජා ජමෝරින් රජු ක්‍රිෂ්ණාට්ටම් සඳහා දායක්වය දැක්වූ බව.
* තාම්පුරන් රජු රාජාට්ටම් සඳහා දායකත්වය දැක් වූ බව උදාහරණ දෙමින් විස්තර කර ඇත්නම් (ල. 08)
(ල. 20)

08. i. * පූජාර්ථය යටපත් වී විනෝදාර්ථය ඉස්මතු වූ බව.
* නාට්‍යමය සංවාදවල ඇති වූ වෙනස්කම්.
* ශාන්තිකර්ම පැවැත්වූ දින ගණන කෙටිවීම. (කාලය, ස්ථානය හා අවස්ථාව අනුව)
* පැවැත්වීමේ අරමුණු වෙනස් වී ඇති බව. (අධ්‍යාපන කටයුතු, උත්සව කටයුතු, පර්යේෂණ .... ආදී)
* පිනුම්, කරණම් වැනි අංග ඇතුලත් වී ඇති බව.
* පහසුවෙන් භාවිතා කළ හැකි රංග වස්ත්‍රාභරණ හා රංග උපකරණ භාවිතය.... ආදී කරුණු දක්වා ඇත්නම්.
(ල. 06)

ii. * පැරණි ගුරුකුල අධ්‍යාපනය තුළින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් කෙරෙහි ද විධිමත් අධ්‍යාපනය තුළින් න්‍යායාත්මක කරුණු කෙරෙහිද වැඩි අවධානයක් යොමු වූ බව.
* නර්තන විෂය පොත්පත් රාශියක් ප්‍රකාශයට පත්වූ බව.
* ඉගෙනුම් කාර්යයට පහසුවන ආකාරයට සම්ප්‍රදායන් අනුව විෂය කරුණු පෙළ ගැස්වීම. (තාල ක්‍රම, වන්නම් ආකෘතිය, සරඹ දොළහ.... ආදී)
* විභාග ක්‍රම ආරම්භවීම හා නර්තනය පොදු ජනතාව අතරට පත්වීම.
* විෂය නිර්දේශ, ඉගෙනුම් ක්‍රම ශිල්ප, ඇගයීම් ක්‍රම ඇතිවීම.
* සංඛ්‍යාත්මකව ගුරුභවතුන්ගේ හා සිසුන්ගේ වර්ධනයක් සිදුවීම.
* විවිධ ආයතන බිහිවීම (විශ්ව විද්‍යාල, තරුණ සේවා, සර්වෝදය, බෙල්වුඩ් ආයතනය, පෞද්ගලික පන්ති... ආදී)
* උපාධි පිරිනැමීම (උපාධි, පශ්චාත් උපාධි, ආචාර්ය උපාධි ආදී කරුණු විග්‍රහ කර ඇත්නම් ලකුණු) (ල. 06)

iii. * රංග රචනා ක්‍රමවේද ඇති වූ බව (අවකාශ භාවිතය, රංග රටා, හැඩතල හා මෝස්තර යොදා ගැනීම.)
* ඒකල නැටුම් සමූහ වශයෙන් ද සමූහ නැටුම් ඒකල වශයෙන් ද ඉදිරිපත් කරන බව.
* පිරිමින් විසින් කළ නර්තන ස්ත්‍රී නැටුම් බවට පත්වීම. (ගිරි දේවී, නානුමුරය.... ආදී)
* දීර්ඝ නර්තන අංග වේදිකාව තුල කෙටි අංග බවට පත්වීම.
* විදේශීය ශෛලීන්ගේ ආභාසය.
* සැහැල්ලු, සරල රංග වස්ත්‍රාභරණ යොදා ගැනීම හා අංග රචනා ක්‍රම භාවිතය.
* තාක්ෂණික උපකරණ භාවිතය (වේදිකා, ආලෝක, පසුතල නිර්මාණ .... ආදී)
* මුදල් ඉපයීමේ කාර්යයක් ලෙස ඉස්මතු වීම.
* ජන මාධ්‍ය තුළ ජනප්‍රියවීම.
* ගීත නර්තන බිහිවීම.... යනාදී කරුණු විග්‍රහ කර ඇත්නම්. (ල. 08)
(ල. 20)